“කිසියම් විටෙක අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) හට කරුණු දෙකක් අතර තෝරා ගන්නට යමක් දෙනු ලැබූ විට, පාපයක් නොවන තාක් කල් ඒ දෙකින් වඩාත් පහසුම දෑ එතුමාණන් තෝරා ගත්තේය. එය පාපයක් වූයේ නම් එයින් ජනයාට වඩා එතුමාණෝ දුරස් වන්නෙකු වූහ

දේව විශ්වාසීන්ගේ මෑණියක් වූ ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමිය විසින් මෙසේ වාර්තා කරන ලදී. “කිසියම් විටෙක අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) හට කරුණු දෙකක් අතර තෝරා ගන්නට යමක් දෙනු ලැබූ විට, පාපයක් නොවන තාක් කල් ඒ දෙකින් වඩාත් පහසුම දෑ එතුමාණන් තෝරා ගත්තේය. එය පාපයක් වූයේ නම් එයින් ජනයාට වඩා එතුමාණෝ දුරස් වන්නෙකු වූහ. කිසිම විටෙක කිසියම් කටයුත්තක තම පෞද්ගලික හේතුවක් නිසා අල්ලාහ්ගේ දූතයාණෝ පළිගන්නෙකු නොවූහ. නමුත් අල්ලාහ්ගේ ගෞරවණීය දෙයක් කඩකරනු ලැබුවේ නම් මිස, එවිට උත්තරීතර අල්ලාහ් වෙනුවෙන් එතුමාණෝ සමප්රතිචාර දැක්වූහ.
[صحيح] [متفق عليه]

දේවත්වය විශ්වාස කරන්නන්ගේ මෑණිය් වූ ආඉෂා (රළියල්ලාහු අන්හා) නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ ඇතැම් ගුණාංග පිළිබඳ දන්වා සිටියාය. එහි දී ඇය ප්රකාශ කළ කරුණක් වනුයේ: "සැබැවින්ම සල්ලල්ලාහු අලයිහි වසල්ලම් හට කරුණු දෙකක් අතර තෝරා ගන්නට යමක් දෙනු ලැබූ විට, පාපය නියම නොකරන කල්තාක් වඩාත් පහසුම දෑ එතුමාණන් පිළිපැද්දාහ. සැබැවින්ම එය ජනයා ඉමහත් සේ දුරස් කරවන්නක් වේ. එවිට හෙතෙම තෝරා ගනුයේ වඩාත් දුෂ්කර දෑය. සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණෝ කිසියම් පෞද්ගලික හේතුවක් නිසා පළිගන්නෙකු නොවූහ. එතුමාණෝ සමාව දී තම අයිතිය පවා නොසලකා හරින්නෙකු වූහ. නමුත් අල්ලාහ්ගේ ගෞරවණීය කරුණක් උල්ලංගනය කරනු ලැබුවේ නම් එවිට උත්තරීතර අල්ලාහ් වෙනුවෙන් එතුමාණෝ සමප්රතිචාර දැක්වූහ. අල්ලාහ් වෙනුවෙන් වූ කටයුතු වල එතුමාණෝ මිනිසුන් අතරින් වඩාත් දැඩි තැනැත්තෙකු වූහ.

https://sunnah.global/hadeeth/si/show/6389